**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

50 | S | I - II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

### නාට්‍ය හා රංගකලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (3) | 11. | (1) | 21. | (3) | 31. | (3) |
| 2. | (4) | 12. | (4) | 22. | (4) | 32. | (4) |
| 3. | (2) | 13. | (2) | 23. | (4) | 33. | (2) |
| 4. | (2) | 14. | (1) | 24. | (3) | 34. | (3) |
| 5. | (1) | 15. | (2) | 25. | (1) | 35. | (1) |
| 6. | (2) | 16. | (1) | 26. | (3) | 36. | (1) |
| 7. | (3) | 17. | (3) | 27. | (2) | 37. | (4) |
| 8. | (4) | 18. | (3) | 28. | (3) | 38. | (2) |
| 9. | (4) | 19. | (4) | 29. | (1) | 39. | (3) |
| 10. | (2) | 20. | (2) | 30. | (2) | 40. | (2) |

### II කොටස

01. (i) පන්සිය පනස් ජාතක කතා පොතේ උම්මග්ග ජාතකය

(ii) නාඩගම් සම්ප්‍රදාය (iii) සිරිමලී එතනා, කාලිංග, රාමායණය, විදුර

(iv) 1975 ජනවාරි ලුම්බිණි රඟහල

(v) දික්පිටියා දික්තලා රැගෙන යාමට උත්සාහ කරන අවස්ථාව හා මහෞෂධ පඬිවරයා නඩුව විසඳන්නට සූදානම් වන අවස්ථාව

(vi) නළු නිළියන්ගේ රංගනය, තේමාව, අනුෂාංගික කලා ආදින් නිර්මාණ ශිලිත්වය පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

02. (i) චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් තුළ එහි ජීවත්වීමේ නළු කාර්යයි.
ල. 05

(ii) රූපණ කාර්යයේදී නළුවා අවධානය යොමු කළයුතු කරුණු හතරක් ලියන්න.
❋ කෙබඳු කායික ස්වරූප ඇත්තෙක්ද?
❋ කෙබඳු මානසික ස්වභාව ඇත්තෙක් ද?
❋ තමාට හිමි චරිතය මේ අන්දමට ක්‍රියා කරන්නේ ඇයි?
❋ මේ වචන ප්‍රකාශ කරන්නේ ඇයි? යනාදි පිළිතුරට සමාන අදහස් ඇත්නම් ලකුණු ලබාදෙන්න. ල. 04

(iii) අමාරුකම් ගණන් නොගැනීම, ආත්ම ශක්තිය වර්ධනය කර ගැනීම, නායකත්වයට හුරු වීම, අධිෂ්ඨානය, කැපවීම මතක තබා ගැනීම, පුහුණුවීම් යනාදි ගුණාංග සාකච්ඡා කරමින් ඒවා වර්ධනය කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය රංග අභ්‍යාස යනාදිය ප්‍රගුණ කර ගැනීම මගින් අභ්‍යන්තරික ප්‍රකාශන බාහිර ප්‍රකාශන ප්‍රගුණ කර ගැනීම යනාදි පිළිතුර හා සම්බන්ධ පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න.
ල. 05

03. (i) යම් දෙපාර්ශවයක් අතර ඇතිවන පරස්පර විරෝධී අදහස් නිසා මතුවන අර්බුදකාරී අවස්ථා නාට්‍යෝචිත අවස්ථා වේ. ල. 03

(ii) යම් කිසි ගැටලුකාරීත්වයක් සහිත අවස්ථාවන් තිබීම
චරිත යම් ප්‍රශ්නයකට මුහුණ දී තිබීම
කුතුහලාත්මක බවක් අන්තර්ගතව පැවතීම
(ල. 03)

(iii) තමා නැරඹූ නාට්‍ය ගැටුම් අවස්ථා දෙකක් නම් කර විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(ල. 06)

04. (i) දෙන ලද ඉඟියකට අනුව, පිටපතක් නොමැතිව සූදානම් වීමකින් තොරව කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් නිරූපණය කිරීමයි.
(ල. 03)

**Answer**

(ii) පරිකල්පනය, ක්ෂණිකව ක්‍රියාත්මක වීම සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව අභිනය මැනවින් භාවිත කිරීම, නිර්මාණශීලීත්වය යනාදි පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 04)

(iii) ක්ෂණික නිරූපණ මාතෘකාව - 1
සූදානම් වූ ආකාරය - 2
මතු වූ ගැටළු - 2
05

විස්තරකර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

05. (i) මුහුණ ප්‍රධාන කොටගත් ප්‍රේක්ෂකයාට පෙනෙන සිරුරේ කොටස් චරිතයකට ගැළපෙන පරිදි රචනා කිරීමේ කලාව/හෝ ආලෝකකරණය නිසා නළුවාගේ මුහුණේඇතිවන පැතලි බව මඟහරවා ගනිමින් ත්‍රිමාණිගතිය මතුකර ගැනීමට සිදු කෙරෙන කාර්ය හෝ රූපණයේදී නළු නිළියන්ගේ මුහුණුවල ලක්ෂණ නාට්‍යකට අවශ්‍ය පරිදි වෙනස් කර ගැනීමේ කාර්ය යනාදි පිළිතුරට සමාන අදහස් ඇත්නම් ලකුණු ලබා දෙන්න.
ල. 03

(ii) සරල අංගරචනය - නළුවාගේ බාහිර ස්වරූපය වෙනසක් සිදු නොකොට සිදු කරන **අංග රචනයයි.**
(උදා ලෝකධර්මී නාට්‍ය චරිත නම්)
**චරිතාංග අංග රචනය**
නළුවාගේ බාහිර ස්වරූපය වෙනසක් සිදු කරමින් සිදු කෙරෙන අංග රචනයයි. (නාට්‍ය ධර්මී චරිත නම් සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. ල. 04

(iii) අංගරචනය සිදු කරන ආකාරය මුහුණ පිරිසිදු කිරීම හිස් දවටනය ඇඳුම දවටනය යනාදි මූලික පියවරේ සිට අංග රචනය ඉවත් කිරීම දක්වා පිළිවෙළින් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. ල. 05

06. (i) කිසියම් සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් අවස්ථාවන් කිහිපයක් නළු නිළියන් හා අනුෂාංගික කලාවත් යොදා රංගගත කිරීමයි. නාට්‍ය සම්බන්ධ වෙනත් හැඳින්වීමක් සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(ල. 02)

(ii) සජීවී කලා මාධ්‍යක් හා නොවන මාධ්‍ය සන්සන්දනය කරමින් පිළිතුර සපයා ඇත්නම් හෝ සජීවී කලාංගයක් වන ආකාරය පැහැදිලි කරමින් සාකච්ඡා කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 04)

(iii) සාමූහික ප්‍රයත්නයක් වන්නේ කෙසේදැයි පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

07. (i) රංගවිධාන/සංවාද යොදා නාට්‍ය පෙළ රචනා කර තිබීම. (ල. 04)

(ii) නාට්‍යෝචිත අවස්ථා මතුකිරීම (ල. 04)
සමස්ත නිර්මාණය (ල. 04)
12